සිංහල／シンハラ語

日本年金機構
Japan Pension Service

XXXX XX, 20XX

හිතවත් සේවායෝජකය,

අධ්‍යක්ෂ,
JPS XXXX ශාඛා කාර්යාලය

## නැවත සිහි කැඳවීම: EPI සහ EHI ලියාපදිංචිය සඳහා ඉල්ලීම

සේවක විශ්‍රාම වැටුප් රක්ෂණය (EPI) සහ සේවක සෞඛ්‍ය රක්ෂණය (EHI) මගින් ආවරණය වන පරිදි ඔබේ සේවා ස්ථානය ලියාපදිංචි කරන ලෙස ඉල්ලා අපි දැනටමත් ඔබට ලිපියක් යවා ඇති බව මතක් කර දීමට කැමැත්තෙමු. කෙසේ වෙතත්, අපගේ වාර්තාවලින් පෙනී යන පරිදි ඔබ මෙතෙක් එය සම්පූර්ණ කර නොමැති බවයි.

ඔබේ සේවකයින්ට ආවරණයක් ස්ථාපිත කිරීමට ඔබ අපොහොසත් වුවහොත්, අවශ්‍ය අවස්ථාවේ දී වෛද්‍ය සහ ආදායම් ආරක්ෂණ පද්ධති මගින් ඔවුන් ආරක්ෂා නොකෙරේ. ඊට අමතරව, (EPI පනතේ 100 වන වගන්තිය සහ EHI පනතේ 198 වන වගන්තියට අනුව), ඔබේ සේවා ස්ථානයට අප පැමිණ විමශර්නකල හැකි අතර, එවිට වඩාත් වැඩි දණ්ඩණයන් පැනවිය හැකිය.

**පහත දැක්වෙන අපගේ ශාඛා කාර්යාලයට පැමිණ <u>XXXX XX, 20XX</u> වන දිනට පෙර මෙම ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය සම්පූර්ණ කරන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටින්නෙමු.** කරුණාකර My Number Card, විදේශ ගමන් බලපත්‍රය/නේවාසික පදිංචි කාඩ් පත වැනි ඔබගේ අනන්‍යතා පත්‍රරැගෙන ඒමට වග බලා ගන්න.

අපගේ ශාඛා කාර්යාලයෙන් භාෂා කිහිපයක් සඳහා නොමිලේ භාෂණ පරිවතර්න සේවය ලබා ගත හැකි වුව ද, ඔබට ජපන් භාෂාව කතා කරන කෙනෙකු කැඳවා ගෙන ඒමටහැකිය.

ඔබේ සේවකයින් කෙරෙහි ඔබ දක්වන දැනුවත්භාවය සහ සැලකිල්ල කෙරෙහි අපි ඔබට ස්තූති කරමු.